සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :- 11 ශ්‍රේණිය **විෂය** :- චිත්‍ර **අදාළ සතිය** :- නොවැම්බර් 1 වන සතිය

**2.පාඩම/ ඒකකය**:- 7.3.1 මහනුවර යුගයේ පහතරට බිතු සිතුවම් අගයමු

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- ප්‍රදර්ශනය කර ඇති කතළුව හා කරගම්පිටිය විහාර චිත්‍ර නිර්මාණ හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකාව හොඳින් අධ්‍යයනය කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  1. මහනුවර යුගයේ පහතරට විහාර බිතු සිතුවම් කලාවේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
  2. කතළුව හා කරගම්පිටිය විහාර චිත්‍ර නිර්මාණවල ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.
     - යුගය/ කාලය
     - අනුග්‍රහය
     - ශිල්පියා
  3. කතළුව විහාරය හා කරගම්පිටිය විහාර සිතුවම් නම් කර එම එක් එක් සිතුවම් පිළිබඳ පහත කරුණු යටතේ කලාත්මක ඇගයීමක් කරන්න.
     - වස්තු විෂය
     - සම්ප්‍රදාය / ශෛලිය
     - ශිල්ප ක්‍රමය
     - කලාත්මක ලක්ෂණ
       - තලය මත රූප භාවිතය
       - වර්ණ භාවිතය
       - රේඛාකරණය
       - අදහස් ප්‍රකාශනය

## කතළුව විහාර චිත්‍ර

- දකුණු පළාතේ ගාල්ල නගරයට ආසන්නව පිහිටා ඇති කතළුව විහාර බිතු සිතුවම් දහනව වන සියවසේ අගභාගයට (ක්‍රි.ව 1886) අයත් නිර්මාණ ලෙස සැලකේ.
- මෙම විහාරයේ බිතු සිතුවම් නිර්මාණය කළ ශිල්පීන් වශයෙන් කඩොල්ගල්ලේ මහ සිත්තරා හා පොඩ්ඩ සිත්තරා යන ශිල්පීන් හඳුන්වා ඇත.
- පහතරට විහාර බිතුසිතුවම් සඳහා විදේශීය ආභාස හා සමකාලීන සමාජ පසුබිම බලපා ඇති ආකාරය දක්වන හොඳම නිදසුනක් වශයෙන් මෙම විහාර සිතුවම් සැලකේ.
- කතළුව විහාරයට අයත් සිතුවම්වල වස්තු විෂය පහත ලෙස වර්ග කළ හැකි ය.
  - බෞද්ධ ජාතක කථා (වෙස්සන්තර, මහා සුතසෝම, තේමිය, චුල්ලපදුම)
  - බුද්ධ චරිතයට සමකාලීන සමාජ සිදුවීම් (මහාධන සිටුවරයාගේ කථාව, පටාචාරා කථාව, නන්දිය උපාසක කථා වස්තුව)
- එම නිර්මාණවලට අමතර ව සූවිසිවිවරණය, අපාය දර්ශන, වියන්තල සිතුවම් හා දිව්‍යලෝක දර්ශන සහිත සිතුවම් ද වේ.

## මහාධන සිටුවරයාගේ කථාව  සංගීතය හා විනෝද වීම

- කතළුව විහාරයේ දැකිය හැකි චිත්‍රයක් වන මෙයින් මහාධන සිටුවරයාගේ නිවසේ පැවති නැටුම් හා ගැයුම් සංදර්ශනයක අවස්ථාවක් නිරූපණය කෙරේ.
- මෙහි දක්වෙන සංගීත කණ්ඩායමේ සාමාජිකයෝ යුරෝපීය ක්‍රමයට ඇඳ පැලඳගෙන බටහිර සංගීත භාණ්ඩ වාදනය කරමින් සිටිති.
- පසුබිමෙන් දක්වෙන ගොඩනැගිල්ල යුරෝපීය ලක්ෂණයන්ගෙන් යුතු වේ.
- මෙම සිතුවමේ නිරූපිත ඇඳුම් පැලඳුම්, සංගීත භාණ්ඩ, ගෘහනිර්මාණ අංග හා ගෘහභාණ්ඩ මෙන්ම විනෝදාංග ද එකල ලාංකේය සිත්තරුන් දුටු යුරෝපීය ලක්ෂණවලට අනුගත වූ ඒවා වේ.
- අඛණ්ඩ කථන ක්‍රමයට අඳින ලද කථාවක එක් කොටසක් මෙයින් දක්වේ.
- සම්පූර්ණ තලය භාවිත කොට සිද්ධිය සංරචනය කොට තිබේ.
- රේඛා හා හැඩතල යොදා ගනිමින් සංකීර්ණ ලෙස අවකාශය පුරවා ඇත.
- කහ, කළු, සුදු, නිල්, රතු, කොළ සහ දුඹුරු යන වර්ණ සහ ඒවායේ ප්‍රභේද භාවිත කොට සිතුවම් වර්ණ කොට තිබේ.
- රූප වටා කළු පැහැති බාහිර රේඛා යොදා ඇත.
- පසුබිම වර්ණ කිරීම සඳහා කහ, කළු, දුඹුරු යන වර්ණ භාවිත කොට ඇත.
- ත්‍රිමාන ලක්ෂණ පෙන්වීම සඳහා සියුම් ලෙස වර්ණ ප්‍රභේද දක්වීමට ගත් උත්සාහය දැකිය හැකි ය.
- සමස්ත චිත්‍රයේ ශෛලිගත ආකාරයට වඩා ජීවී බවක් ප්‍රකාශනය වේ. එසේ ම වර්ණ පැතලි ව දක්වීමට වඩා වර්ණ පදාස දක්වීම ද දැකිය හැකි ය.



**01. මේ මඟින් නිරූපණය වනුයේ** ..........................................................................

**02. ස්ථානය** ..........................................................................

**03. සංරචන ක්‍රමය** ..........................................................................

**04. වර්ණ භාවිතය** ..........................................................................

**05. රේඛාව යෙදීම** ..........................................................................

## සුතසෝම ජාතකය රජමැඳුරේ කාන්තාවෝ

- කතළුව විහාරයේ දැකිය හැකි මෙම සිතුවමින් බ්‍රහ්මදත්ත රජුගේ මාළිගාවේ සිටින කාන්තාවන් දෙදෙනකු පිළිසඳරේ යෙදී සිටිනු දක්වේ. මින් රජ බිසව හා ඇයට පවන් සලන සේවිකාව නිරූපණය කෙරේ.
- අඛණ්ඩ කථන ක්‍රමයට අඳින ලද සිතුවමක එක් සිද්ධියක් මෙයින් දක්වේ. එහි රූප පාර්ශ්වදර්ශී ස්වරූපයෙන් හා ශෛලීගත ව නිරූපණය කර ඇත.
- මෙහි නිරූපණය වන කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් විසිතුරු මල් මෝස්තර හා හැඩතලවලින් සරසා තිබේ.
- මාලිගාව යුරෝපීය ක්‍රමයට සරසා ඇත. විශේෂයෙන් යුරෝපීය ලාම්පු, ගෘහය අලංකරණය සඳහා යොදා ගෙන ඇත.
- කහ, කළු, සුදු, නිල්, රතු, කොළ සහ දුඹුරු යන වර්ණ සහ ඒවායේ ප්‍රභේද භාවිත කොට සිතුවම් වර්ණ කොට තිබේ.
- කළු පැහැති බාහිර රේඛා රූප වටා යෙදීමට මෙන් ම චිත්‍රයේ විස්තරාත්මක බව දැක්වීම සඳහා භාවිත කර ඇත.
- රූප එකම තලයක පිහිටුවා තිබීම දකිය හැකි ය.
- පසුබිම සඳහා කළු වර්ණය භාවිතය හා පසුබිම් අවකාශය පිරවීම සඳහා විවිධ සැරසිලි මෝස්තර භාවිතය මෙහි සුවිශේෂ ලක්ෂණ වේ.



**06. දක්නට ඇති ස්ථානය** ......................................................................

**07. මේ මඟින් දැක්වෙනුයේ** ......................................................................

**08. සංරචන ක්‍රමය** ......................................................................

**09. වර්ණ භාවිතය** ......................................................................

**10. තලය භාවිතය** ......................................................................

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක :-**

e - නැණ පියස:- 11 ශ්‍රේණිය චිත්‍ර කලාව
11 ශ්‍රේණිය චිත්‍ර කලාව අතිරේක කියවීම් පොත - ජාතික අධ්‍යාපන ආයතනය

**5.ඉගෙනුම් ඵල :-**

- පහතරට විහාර බිතු සිතුවම් කලාවේ ඓතිහාසික පසුබිම සොයා බලයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- මහනුවර යුගයේ පහතරට විහාර බිතු සිතුවම්වල තොරතුරු එක්රැස් කරයි.
- සිතුවම් නිර්මාණ අගයයි, රස විඳියි.

**සැකසුම** :- කෑගල්ල අධ්‍යාපන කලාපය